RARE

# අන්තර්ජාලය ශ්‍රී ලංකාවේ පාසල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි ඇති කරන බලපෑම.

ඉදිරිපත් කරනු ලබන්නේ

එච්. වී. එම් සිල්වා

FGS/M/MSSc/2006/18

සමාජීය විද්‍යාපති ජන සන්නිවේදන උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

ප්‍රවේශ අංකය: 1251
වර්ග අංකය:

මාර්තු 2015

# නිබන්ධ සාරාංශය

නව මාධ්‍යයේ සම්ප්‍රාප්තියත් සමග අන්තර්ජාලය කරළියට පැමිණ හමාරය. එය සාරගර්භවූත් වැදගත්වූත් විඥාපන අමුද්‍රව්‍ය සහිත මාධ්‍යයක් සේම සංස්කෘතියට පටහැණිවූත් අහිතකර බලපෑම් ඇති කරන්නාවූත් මාධ්‍යයක් ද වී ඇත. එකී අහිතකර බලපෑම් අතර පාසල් ළමුන් වෙත කෙරෙන බලපෑම බලවත්ය. ඒ අතුරින් ද පාසල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි අන්තර්ජාලයේ බලපෑම කතාබහට ලක් වී ඇත. තත්ත්වය එසේ බැවින් ශ්‍රී ලංකාවේ පාසල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි අන්තර්ජාලයේ බලපෑම පර්යේෂණාත්මකව සොයා බැලීම වැදගත් වන අතර එය අභිමතාර්ථය කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

සමස්ත ලෝකයේම වර්ධනීය තලයකට පත්ව ඇති මෙම අති නවීන සන්නිවේදන පද්ධතිය ශ්‍රී ලාංකේය පාසල් ප්‍රජාව භාවිත කරන ආකාරය සොයා බැලීමත් ඉන් ඔවුන්ගේ ආකල්ප පද්ධතියේ මෙන්ම හැසිරීම් පද්ධතියේ ඇති කරනු ලැබූ වෙනස සොයා බැලීමත් මෙම පර්යේෂණයේ දී අධ්‍යයනයට බඳුන් විය. ඒ අනුව අන්තර්ජාලය පාසල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි ඇති කරන බලපෑම සොයා බැලීම අරමුණු කර ගත් මෙම පර්යේෂණය සඳහා කළුතර දිස්ත්‍රික්කයට අයත් පාසල් 8ක ළමුන් 80 දෙනෙකු සහ ගුරුවරුන් 20 දෙනෙකු අයත් නියැදියක් යොදා ගනු ලැබූ අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා භාවිතයෙන් පර්යේෂණය සිදු කරනු ලැබී ය. මෙහිදී ළමයා පිළිබඳ, ළමා චර්යාවන් පිළිබඳ මෙන්ම සන්නිවේදනය හා සංහතික මාධ්‍ය පිළිබඳ න්‍යායික හා සංකල්පීය තොරතුරු සාකච්ඡා කරනු ලැබේ. අන්තර්ජාලය පිළිබඳ පුළුල් විග්‍රහයක් සහිතව අන්තර්ජාලය ඇතුළු සමාජ මාධ්‍ය පාසල් ළමුන් කෙරෙහි ඇති කරන බලපෑම පර්යේෂණාත්මකව අධ්‍යයනයට ලක් කර ඇත.

අන්තර්ජාලයෙන් හඳුනාගත් පුද්ගලයින් පෞද්ගලිකව මුණ ගැසීම දක්වා අන්තර්ජාල සබඳතා ගොඩනගා ගැනීම තුළ පාසල් ළමුන්ගේ පෞද්ගලික සබඳතා ගොඩනැගීමෙහි මෙන්ම ඒ හා සම්බන්ධ චර්යාවන් වෙනස්වීමෙහිලා අන්තර්ජාලය බලපෑම් කරන බවත් ශ්‍රී ලාංකේය පාසල් ප්‍රජාව අන්තර්ජාලය අවභාවිතයේ යෙදවීම සිදු කරන බවත් පාසල් ළමුන්ගේ ලිංගික චර්යාවන් වෙනස් කිරීමෙහි ලා අන්තර්ජාලය බලපෑමක් සිදු කරන බවත් මෙම අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි වේ. ඒ අනුව අන්තර්ජාලය මෙන්ම නව මාධ්‍ය භාවිත කිරීම පිළිබඳ නිපුණතාව ශ්‍රී ලාංකේය පාසල් සිසුන් වෙත ලබා දීමේ අවශ්‍යතාව මෙන්ම මාධ්‍ය අධ්‍යාපනය විෂයයක් ලෙස පාසල් තුළ ස්ථාපිත කිරීමේ කඩිනම් අවශ්‍යතාවත් මෙම අධ්‍යයනයෙන් පෙන්වා දෙයි. එසේම සියලු පාසල් ආවරණය වන පරිදි පාසල් ළමුන්ට ඉතා නිවැරදි ලිංගික අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව ද මෙම නිබන්ධයෙන් අවධාරණය කෙරේ.


පාරිභාෂික පද මාලාව - පාසල් ළමුන්, ලිංගික චර්යාවන්, මාධ්‍ය සාක්ෂරතාව, අන්තර්ජාලය භාවිතය, මාධ්‍ය අධ්‍යාපනය.

## Abstract

With the arrival of new media the internet has invaded the society. It has become not only an important fertile media with raw materials, but also a media that creates a very harmful impact on the society. Among the harmful effects of internet, the effect on school children has become a major problem. This influence causes a major affect on the school children's sexual behavior is a topic that is worth speaking of. Therefore this study is meant to find out closely internet use and its effect on sexual behavior in Sri Lankan School children.

Special attention was paid in this research to study how the Sri Lankan school children used this mode of communication and the difference it caused in their attitudes and behavior. Accordingly with this aim of researching how the internet affects the Sri Lankan students' sexual behavior, 80 students and 20 teachers of 08 schools in Kalutara district were used as the sample of this study and the research was conducted using the questionnaire and interviews. Here this study was extended to find out theoretical and conceptual details about the child, child behavior, communication, new media and internet in a broad scale.

It could be identified that the internet has a direct impact for the students on building on-line relationships with people whom they meet through social media and also it effects to change their behavior. The students carry out private relationship through the internet and also it is revealed that they misuse the internet as a result the internet has a direct impact on changing the sexual behavior of Sri Lankan school children. Therefore there is a need to introducing how to use internet and new media to the Sri Lankan education system and also there is an emergency need to include media education into the curriculum. Also this dissertation emphasizes the need of introducing correct sexual education programmes to all schools in Sri Lanka.



**Key words** - School children, Sexual behavior, Media Literacy, Internet usage, Media Education.